INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

HAUSFELD

# ජනාධිපති ධූරාපේක්ෂක ගෝඨාභය රාජපක්ෂට එරෙහිව තවත් ශ්‍රී ලාංකික දස දෙනෙක් වධහිංසා සම්බන්ධයෙන් එක්සත් ජනපදයේදී නඩු දමති

***(ජොහැන්නස්බර්ග්, දකුණු අප්‍රිකාව/ වොෂිංටන්, ඩීසී) -*** **2019 ජූනි 27**

ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම් ලෙසින් සිටියදී වධහිංසාවට ගොදුරු වූ වින්දිතයන් විසින් වන්දි ඉල්ලා එක්සත් ජනපදයේ මධ්‍යම කැලිෆෝනියා දිස්ත්‍රික්කයේ පවරා ඇති අලුත් නඩු දහයකට මුහුණ දීමට ශ්‍රී ලංකාවේ ජනාධිපති වීමේ අපේක්ෂාවෙන් හිඳින ඔහුට සිදුවී තිබේ.

ආරක්ෂාව සලසාගැනීමේ අවශ්‍යතාව නිසා නිර්නාමිකව සිටීමට සිදුවී ඇති පැමිණිලිකරුවන් විසින් ජූනි 26 වැනිද අධිකරණයේ ගොනු කරන ලද ලියකියවිලි වල මුළුමනින්ම රාජපක්ෂ මහතාගේ පාලනය යටතේ තිබූ පොලිස් ස්ථාන හා හමුද කඳවුරු වලදී අත්විඳි බියකරු කෙලෙසීම් විස්තර කර තිබේ. ගිනියම් යකඩ පොලු වලින් ඔවුන් හංවඩු ගසා තිබේ. කේබල් කම්බි වලින් පහර දී තිබේ. පැට්‍රෝල් දැමූ ප්ලාස්ටික් මලුවල ඔලුව ඔබා හුස්ම හිරකර තිබේ. ඒ අතරින් හය දෙනකු පුන පුනා දූෂණය කර ලිංගික වශයෙන් කෙලෙසා තිබේ. පැමිණිලි ගොනුකළ දහදෙනාගෙන් දෙදෙනෙක් කාන්තාවන්ය. අටක් දෙමළය, දෙදෙනෙක් සිංහලය.

මේ නඩුකරය සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) හා එක්ව නඩුව සඳහා වින්දිතයන් නියෝජනය කරන හවුස්ෆෙල්ඩ් ජාත්‍යන්තර නීතිඥ සමාගම පුරා අවුරුදු හයක් තිස්සේ කරන ලද විමර්ශනයක ප්‍රතිපලයයි.

මීට ඉහතදී මුලින්ම රෝයි සමාදනම් වෙනුවෙන් අප්‍රේල් 5 වැනිද මුලින්ම ගොනු කරනු ලැබූ පැමිණිල්ලකට මේ අලුත් පැමිණිලිකරුවෝ හවුල් වී සිටිති. නඩුව පවරනු ලැබුවේ වධහිංසාවට ගොදුරුවූ වින්දිතයන්ට එක්සත් ජනපදයේ නෛතික සහන සලසන්නාවූ, වධවින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත (Torture Victim Protection Act) යටතේය. රාජපක්ෂ මහතා නියෝජනය කරන බව පවසමින් සමාදනම් මහතා සෘජුව අමතා ඔහුට තර්ජනය කළ තුන්දෙනකු වලක්වා ලන ලෙස ඉල්ලන තවත් අයැදුම් පතක් අප්‍රේල් 29 ද අධිකරණයට භාරදෙන ලදී.

දණ්ඩ මුක්තිය භුක්ති විඳිමින් සැකකරුවන් සංවිධානාත්මකව පැහැරගනිමින්, වද දෙමින්, දූෂණය කරමින්, කප්පම් මුදල් ලබා ගත් ආරක්ෂක හමුද වලට අණ

දුන්නේ 2005 සිට 2015 දක්වා ශ්‍රී ලංකාවේ බලසම්පන්න ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ, ජනාධිපති වරයාගේ සහෝදරයාද වූ, රාජපක්ෂ මහතා බවට පැමිණිලිකරුවෝ චෝදනා කරති. මේ කෙලෙසීම් සිදුවන වකවානුවේ ගෝඨාභය රාජපක්ෂ ඇමරිකා එක්සත් ජනපද පුරවැසියෙකි.

තමන්ට වධහිංසා පැමිණවීම සඳහා සෘජුවම සම්බන්ධ වූ බවට චෝදනා ලබන ආරක්ෂක අංශවල නිලධාරීන් ගණනාවක්ද පැමිණිලිකරුවන් විසින් නම් කර තිබේ. ඒ අතර ශ්‍රී ලංකාවේ ඉහලම පොලිස් විමර්ශක නිශාන්ත ද සිල්වා ද වෙයි. ඔහු තමන්ගේ සර්වාංගයම තලා, වේදනාකාරී ලෙසින් සිවිලිමෙන් දෙපයින් එල්ලා තැබූ බවට එක් වින්දිතයකු චෝදනා කරයි. කොළඹ ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ (TID) යේ කලින් ස්ථානාධිපතිව සිටි ප්‍රසන්න ද අල්විස් ද වධහිංසාවට අණ දුන්, ඇතැම් අවස්ථාවල වධහිංසා කිරීමට සහභාගි වූ නිලධාරියකු ලෙස පැමිණිලිකරුවන් විසින් නම් කර තිබේ. ඔහුට සෘජුවම ගෝඨාභය රාජපක්ෂ ගෙන් උපදෙස් ලැබුනු බවට චෝදනා කෙරේ.

*"ශ්‍රී ලාංකිකයන්ට රට තුල යුක්තිය සාක්ෂාත් කරගත නොහැක්කේ මන්ද යන්න අපරාධ චූදිතයන් පොලිසියේ ප්‍රධාන විමර්ශක තනතුරු වල හිඳීමෙන් පෙනී යයි,"* යනුවෙන් ITJP විධායක අධ්‍යක්ෂිකා යස්මින් සූකා පැවසුවාය. *"ඔවුන් සතු එකම විකල්පය විදේශයකට නඩුව ගෙනයාම පමණි."*

කැලිෆෝනියාවේ ගොනු කරන ලද නෛතික ලියවිලිවල 2008 සහ 2013 අතර කාල වකවානුවේ දී, කුප්‍රකට වවුනියාවේ ජෝසප් කෑම්ප් ඇතුළු හමුදා කඳවුරු තුලද, කොළඹ සහ පුල්මුඩේ පොලිස් ස්ථානවලද, බූස්ස රැඳවුම් මධ්‍යස්ථානයේද සිදුකළ වධහිංසා පිළිබඳ සවිස්තර සාක්ෂි වාචක ඇතුලත් වෙයි. හමුදා බුද්ධි අංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය සහ විශේෂ බුද්ධි සේවාව වගකිවයුතු ඒකක ලෙස නම් කර ඇත.

විද්‍යා ජයකුමාර් යන අන්වර්ථ නාමයෙන්, රාජපක්ෂ මහතාට නඩු පවරන එක් දෙමළ කාන්තාවක්, යුද්ධය අවසන් වී මාස කිහිපයකට පසු තමන් හමුදා කඳවුරකට ගෙනයනු ලැබූ ආකාරය විස්තර කරයි. ඇයට අලුත් ඇඳුමක් ඇන්දවූ සිංහල සෙබලියන් විසින් ඇය ගැට ගසනු ලැබූ පසු, මේජර් මනතුංග නම් අණදෙන නිලධාරියා කුරිරු ලෙස ඇය දූෂණය කර ලිංගික වශයෙන් කෙලෙසීය. තවත් තරුණ දෙමළ කාන්තාවන් පිරිසක් සමග ඇය කාමරයක රඳවා තබන ලද අතර, සේවය අවසන් කරන කඳවුරේ සොල්දදුවෝ සෑම රාත්‍රියකම පැමිණ දූෂණය කිරීම පිණිස කාන්තාවක් තෝරා ගත්හ. පසුව පොලිස් මුලස්ථානයේදී ඇයට ලිංගික වධහිංසා පමුණුවන ලද අතර, තවත් හමුදා කඳවුරකදී නැවත නැවතත් දූෂණය කරන ලදී. ඇය සිරකොට තබාගත්තවුන් ඇයටත් අනිකුත් කාන්තාවන්ටත්, ගර්භනී නොවන පිණිස විවිධ පරිශ්‍රවලදී උපත් පාලන එන්නත් ලබා දුන්හ.

*"අවංකවම කියතොත්, මේ ලිංගික වහල්කම් පිළිබඳව මා විසින් අසා ඇති නරකම කතාවයි,"* යනුවෙන් නඩුව පැවරූ හවුස්ෆෙල්ඩ් සමාගමේ මානව

*හිමිකම් නීතිඥ ස්කොට් ගිල්මෝර් පැවසීය. "ගෝඨාභයගේ ආරක්ෂක හමුද විසින් අපේ සේවාදයකයන්ට එරෙහිව යෙදවූ ලිංගික ප්‍රචණ්ඩතාව සහ අපරාධකරුවන් සපුරාම අත් විඳින දණ්ඩ මුක්තිය පෙන්නුම් කරන්නේ ලිංගික දූෂණය ශ්‍රී ලංකාවේ ආයතනික ප්‍රතිපත්තියේ අංගයක් වූ බවයි."*

*"රෝයි සහ මේ නඩුකාරය සඳහා අලුතින් පැමිණිලි ගෙනෙන්නට ඉදිරිපත් වූ පිරිමි සහ ගැහැණු දස දෙනාගේ ඉමහත් ධෛර්යයට මම ආචාර කරනු කැමැත්තෙමි,"* යි හවුස්ෆෙල්ඩ් සභාපති මයිකල් හවුස්ෆෙල්ඩ් පැවසීය. *"මේ ක්ෂතිමය අත්දැකීම් අපේ නීතිඥවරුන් හමුවේ නැවත නැවතත් කියාපෑම ඊට සහභාගි වූ සැමදෙනාටම මහත් වේදනාකාරී වූ අතර, ඔවුන්ට යෝග්‍ය වූ නිසි ගෞරවයෙන් යුතුව යම් යුක්තියක් සලසා දීම සහතික කරනු සඳහා අපට කළ හැකි උපරිමය කරන්නෙමු."*

## වැඩිදුර මාධ්‍ය විමසීම් සඳහා අමතන්න:

සොෆී ටොමසිස් sophie@tpr-media.com +44 020 8347 7020 +44(0)7974 428858 හෝ සෙසිල් සූර්බේ cecile@tpr-media.com

Sophie Toumazis at sophie@tpr-media.com or +44 020 8347 7020 +44(0)7974 428858 or Cécile Sourbes at cecile@tpr-media.com for press enquiries

## පැමිණිලි කරුවන් පිළිබඳ සාරාංශය

- **රෝයි සමාදනම්** - ශ්‍රී ලංකාවට යනවිට අත් අඩංගුවට ගන්නා ලද කැනේඩියානු දෙමළ රෝයි සමාදනම්ට පයිප්ප බට සහ රයිෆල් බඳින් පහර දී, බිරිඳ සහ දරුවන් දූෂණය කොට මරා දමන ලද බවට තර්ජනය කිරීමෙන් පසු ඔහුගෙන් බලහත්කාරයෙන් පාපොච්චාරණයක් ගන්නා ලදී.

- **රමේෂ් දේවරාජන් (අන්වර්ථ නාමය)** - දෙමළ මානව හිමිකම් ක්‍රියාධරයකු වන ඔහුගේ හිස භූමිතෙල් දැමූ ප්ලාස්ටික් කවරයක ගිල්ලා හුස්ම හිරකොට, සිවිලිමේ දෙකකුලින් එල්ලා, ඔහුගේ යටිපතුලට පොලිස් නිලධාරීන් විසින් බැටන් පොලු වලින් තලන ලදී.

- **ශාන්ති පද්මනාදන් (අන්වර්ථ නාමය)** - ආණ්ඩුවට එරෙහිව විරෝධතා පැවැත්වූ තරුණ දෙමළ කාන්තාවක් වන ඇය පැහැරගෙන ගොස් පොලිසිය විසින් ප්‍රශ්න කරමින් පිට පිට දූෂණය කොට, පහරදී, සිගරට්වලින් පුළුස්සා, ගිනියම් යකඩ පොල්ලකින් හංවඩු ගසන ලදී.

- **නිමල් ජයසූරිය (අන්වර්ථ නාමය)** - සිංහල මානව හිමිකම් ක්‍රියාධරයකු වූ ඔහුට පොලිසිය විසින් පහර දී දෙමළ සිරකරුවන්ට වද දෙනු බලා ඉන්නට බල කරන ලදී. ඒ, සිය වෘත්තීය සගයන් පාවා දෙනු පිණිසය.

- **විද්‍යා ජයකුමාර් (අන්වර්ථ නාමය)** – යුද හමුදවට භාරවූ LTTE ආණ්ඩුවේ සිවිල් සේවිකාවක් වූ ඇයට කිසිවකු මුණගැසෙන්නට නොදී හමුද කඳවුරුවල හා පොලිස් කාර්යාල වල රඳවාගෙන තිබූ අතර, සිරකොටගෙන සිටි වෙනත් දෙමළ කාන්තාවන් සමග වසර තුනකට වැඩි කාලයක් ලිංගික වහල් කම සහ වධහිංසා විඳීමට බලකරනු ලැබුවාය.

- **සමන් පෙරේරා (අන්වර්ථ නාමය)** – LTTE සංවිධානයට උදව් කළ බවට චෝදනා කරනු ලැබූ සිංහල ආරක්ෂක හමුද සාමාජිකයෙකි. ඔහුට කටුකම්බි සහිත යකඩ බටයක් ගුද මාර්ගයේ යැවීම ඇතුළු වධහිංසා පමුණුවා තිබේ.

- **රමනන් සිවලිංගම් (අන්වර්ථ නාමය)** – LTTE සංවිධානයට ආධාර කිරීම නිසා අත්අඩංගුවට ගන්නා ලද ශිෂ්‍යයෙකි. කිහිප වතාවක් ගිනියම් යකඩින් හංවඩු ගසනු ලැබූ සිවලිංගම්, භූමිතෙල් දමා හුස්ම හිරකොට, මහත් සේ සීතල කළ යකඩ පොල්ලක් ගුද මාර්ගයේ යවා ලිංගික වශයෙන් දූෂණය කරනු ලැබුවෙකි.

- **සුරේෂ් ජෙයබාලන් (අන්වර්ථ නාමය)** - රාජපක්ෂ පාලනය විසින් සිදුකරන ලද මානව හිමිකම් උල්ලංඝන ලේඛනගත කළ ස්වේච්ඡා සංවිධානයක සේවය කළ දෙමළ LTTE සාමාජිකයෙකි. රඳවාගෙන ප්‍රශ්න කරනු ලැබූ ජෙයබාලන් ට පහරදී, සිගරට් වලින් පුළුස්සා,

භූමිතෙල් පෙඟවූ කවරයකින් හුස්ම හිරකළ පොලිසිය විසින් ගුදමාර්ගයේ ඔහු දූෂණය කරන ලදී.

- **මයුරන් රාජ්කුමාර් (අන්වර්ථ නාමය)** - LTTE සංවිධානයට උපකාර කළ බවට චෝදනා කරනු ලැබූ දෙමළ රජයේ ගුරුවරයකු වූ රාජ්කුමාර්, බන්ධනාගාර කඳවුරේ රඳවා තබාගෙන, පහර දී, දුම්වැටි වලින් පුළුස්සා, ගිනියම් යකඩ පොල්ලකින් හංවඩු ගසන ලදී.

- **සෙන්දිල් පුවනේස්වරන් (අන්වර්ථ නාමය)** - බ්‍රිතාන්‍යයේ දෙමළ උපාධි අපේක්ෂක ශිෂ්‍යයකු වූ පුවනේස්වරන්, ශ්‍රී ලංකාවට ගොස් සිටියදී, පොලිසිය විසින් පැහැරගෙන සිර කඳවුරකට යවා, පහරදී, පාපොච්චාරණයක් දීමට එකඟ වන තුරු හම ගැලවී යන තෙක් පිට පිටම රත් යකඩවලින් හංවඩු ගසන ලදී.

- **වසන්ති රත්නසිංහම් (අන්වර්ථ නාමය)** – LTTE ආණ්ඩුවේ සිවිල් මුල්‍ය අංශයේ සේවය කළ තරුණ දෙමළ කාන්තාවක් වූ රත්නසිංහම් යුද කලාපයෙන් පලායනවිට අල්ලාගෙන පොලිස් ස්ථානයක රඳවා තබාගත් ප්‍රශ්න කරන්නන් විසින් ලී පොල්ලකින් දූෂණය කරන ලදී.

## සංස්කාරකවරුන්ගේ දැනගැනීම පිණිස

### ITJP පිළිබඳව

සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) දකුණු අප්‍රිකානු සත්‍ය කොමිසමේ සාමාජිකා නීතිඥ යැස්මින් සූකා විසින් මෙහෙයවනු ලබන රාජ්‍ය නොවන සංවිධානයකි. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියර සහ පශ්චාත් යුද කාල පරිච්ඡේදය ට අදාළ සාක්ෂිවාචක සහ තොරතුරු ඇතුලත් විශාලතම ලේඛනාගාරය ඇත්තේ ඔවුන් සතුවය. යුද්ධයේ සහ වධහිංසා පැමිණවීමේ භූමිකාව සම්බන්ධයෙන් චෝදනා එල්ලවන ශ්‍රී ලංකාවේ විශ්‍රාමික හමුදපති වරයකු චිලී, බ්‍රසීලය, පෙරු සහ කොලොම්බියාවේ තානාපති වරයකු ලෙස කටයුතු කරද්දී ITJP විසින් ඔහුට විරුද්ධව 2017 අගෝස්තුවේදී සර්වලෝක අධිකරණ බලය යටතේ නඩු 4 ක් පවරන ලදී. www.itjpsl.com

### හවුස්ෆෙල්ඩ් පිළිබඳව

හවුස්ෆෙල්ඩ් යනු බර්ලින්, බොස්ටන්, බ්‍රසල්ස්, ඩසල්ඩෝෆ්, ලන්ඩන්, ස්ටොක්හෝම්, නිව්යෝර්ක්, පැරිස්, ෆිලඩෙල්ෆියා, සැන් ෆ්‍රැන්සිස්කෝ සහ වොෂිංටන් ඩීසී හි කාර්යාල සහිත ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර නීති සමාගමකි. එය සංකීර්ණ නඩුකර සම්බන්ධ විශේෂඥ දැනුමක් ඇති ආයතනයකි. එහිදී, ප්‍රතිහාර/තරගකාරිත්වය, මූල්‍ය සේවා, ක්‍රීඩා සහ විනෝද කර්මාන්ත, පාරිසරික, සමූහ අලාභ, පාරිභෝගික ආරක්ෂාව සහ බොහෝ දුරට ජාත්‍යන්තර පරිමාණයේ මානව හිමිකම් කරුණු ආදිය විශේෂිතය. ප්‍රතිහාර/තරගකාරිත්ව නීතිය පුද්ගලිකව බලාත්මක කිරීම සම්බන්ධයෙන් Legal 500 සහ Chambers & Partners විසින් එක්සත් ජනපදයේ සහ යුරෝපයේ ඉහළම තලයේ ශ්‍රේණිගත කර ඇති එකම සමාගම හවුස්ෆෙල්ඩ් වෙයි.

මේ නඩුකරය මෙහෙයවන ප්‍රධාන නීතිඥයා ස්කොට් ගිල්මෝර් ය. යුද මාධ්‍යවේදිනී මාරි කොල්වින් මරාදැමීම සම්බන්ධයෙන් සිරියාවේ අසාද් පාලනයට එරෙහිව වධවින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත පැවරූ නඩුවකින් ඇමරිකානු ඩොලර් මිලියන 303.6 ක් දිනා දීමට ඔහු සමත් විය. www.hausfeld.com

## වෙනත් තොරතුරු

**2019 අප්‍රේල් 9 මාධ්‍ය නිවේදනය:** ශ්‍රී ලංකාවේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට විරුද්ධව ඇමරිකාවේ නඩු පැවරේ http://www.itjpsl.com/assets/press/Final-Press-Release-ITJP-Hausfeld-Sinhala.pdf

**අධිකරණ ලියවිලි සඳහා:** http://www.itjpsl.com/reports/gotabaya-rajapaksa-complaint